# පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ යෝජිත ව්‍යවස්ථා සංශෝධනය - 2018

## විධායක සභාව මගින් පත් කරන ලද ව්‍යවස්ථා සංශෝධන කමිටුව විසින් කරන ලද නිර්දේශ

## 2017 නොවැම්බර් 19, දෙසැම්බර් 10 හා 17 වන දිනයන්හි විදුහල්පතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති විශේෂ විධායක සභා රැස්වීම් වලදී සාකච්ජා කිරීමෙන් පසු අනුමත වූ සංශෝධන

| ව්‍යවස්ථා අංකය | දනට පවතින වගන්තිය | ව්‍යවස්ථා අංකය | යෝජිත සංශෝධන |
|---|---|---|---|
| 4.1 | තත්කාලීන ව්‍යවස්ථාව මේ සමග ඔබට එවා ඇත. | 4.1 | දැනුමැති සමාජයක් උදෙසා ධර්මපාල චින්තනයෙන් පිරිපුන් සුවිශේෂී නිපුණතාවන්ගෙන් යුතු ගුණගරුක පුරවැසියන් නිර්මාණය කිරීම සඳහා දායක වීම. |
| 4.2 | | 4.2 | අනගාරික ධර්මපාල චින්තනයෙන් පෝෂණය වූ ආදි සිසුවෝ වෙමු. |
| 4.3.1 | | 4.3.1 | විද්‍යාලයේ අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික, ක්‍රීඩා, නව නිපැයුම් සහ වෙනත් කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සහ භෞතික සම්පත් ඇති කිරීම, වැඩි දියුණු කිරීම හා ඒවා ආරක්ෂා කර ගනිමින් පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය සහය ලබා දීම. |
| 4.3.5 | | | ඉවත් කර ඇත. |
| 4.4.1 | | 4.4.1 | සංගමයේ පරමාර්ථ සපුරා ගැනීම සඳහා ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ ඒ වෙනුවෙන් දායකත්වය ලබාදිය හැකි සුබපතන්නන්ගේ ක්‍රියාකාරී සහයෝගය සහ ආධාර ලබා ගැනීම හා ඒ සඳහා වූ ක්‍රියා මාර්ග ගැනීම. |
| 4.4.5 | | 4.4.5 | සංගමයේ පරමාර්ථ සපුරා ගැනීම උදෙසා රජයේ ආයතනයක ලියාපදිංචි වීම මගින් ආදි ශිෂ්‍ය සංගමය ආවරණය කිරීම. |
| 4.4.6 | | 4.4.7 | ලෙසින් වෙනස් වී ඇත. |
| | | 4.4.6 නව වගන්තියක් | වර්ෂ 1961 රජයට පවරාදුන් පාසල් ඒකරාශි කර පිහිටුවාගෙන ඇති ශ්‍රී ලංකා බෞද්ධ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සමිති සම්මේලනය ප්‍රධානව අනිකුත් ආදි ශිෂ්‍ය සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියාකිරීම හා ඒ සඳහා ක්‍රියා මාර්ග ගැනීම. |
| 5.1 | | 5.1 | සංගමයේ සාමාජිකත්වය අවම වශයෙන් විද්‍යාලයේ එක් වසරක් ඉගෙනුම ලැබ පාසල් අධ්‍යාපනය අවසන් කළ වයස අවුරුදු 19 ට නොඅඩු ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණක් සීමා වේ. |
| 5.3 | | 5.3 | සුජීවත් පුරවැසියන් 05 දෙනෙකුට යටත්ව සංගමයට, විද්‍යාලයට, බෞද්ධ අධ්‍යාපනයට, රටට, ජාතියට, සංස්කෘතියට හෝ විවිධ ක්ෂේත්‍රයන්ට විශිෂ්ට සේවාවක් ඉටු කළ විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරයෙකු හෝ ආචාර්යවරයෙකු හෝ සේවක මහතෙකු සංගමයේ සම්මාන සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබයි. |
| 6.3.2 | | 6.3.2 | "එනමුදු" වෙනුවට "තවද" යොදා ඇත. |
| 6.3.3. | | 6.3.3 | යාවජීව සාමාජිකත්ව මුදල් ගෙවා අවසන් කරන තෙක් 6.3.2 වගන්තිය අනුව අයදුම් කරනු ලබන සාමාජිකත්වය සාමාන්‍ය සාමාජිකත්වය ලෙස සලකනු ලැබේ. |
| 6.4.1 | | 6.4.1 | අංක 5.3. ඡේදයට අනුව සම්මාන සාමාජිකත්ව සඳහා සුදුසුකම ලබන අයෙකුට විධායක සභාවේ යෝජනාවක් මත මහා සභා රැස්වීමකදී සාමාජිකයන්ගේ අනුමැතියෙන් සම්මාන සාමාජිකත්වය පිරිනැමිය හැකිය. එක් අවස්ථාවක ජීවත්ව සිටින සම්මාන සාමාජිකයින් සිටිය හැක්කේ උපරිම 05 දෙනෙකු පමණි. |
| 6.5.4 | | | ඉවත් කර ඇත. |
| 6.6.1 | | 6.6.1 | අංක 5.2. ඡේදයට අනුව ගෞරව සේවා සාමාජිකත්වයට සුදුසුකම් ලබන අයෙකුට විධායක සභාවේ යෝජනාවක් මත මහා සභා |

| | | | |
|---|---|---|---|
| | | | රැස්වීමකදී සාමාජිකයන්ගේ අනුමැතියෙන් එම සාමාජිකත්වය පිරිනැමිය යුතුය. |
| 6.7.1. | | | ඉවත් කර 7.6 ලෙස දක්වා ඇත. |
| 7.2 | | 7.2 | සම්මාන හෝ ගෞරව සේවා සාමාජිකත්වය පිරිනැමීමට සුදුසු අය සිටී නම් විධායක සභාව විසින් ඒ බවට යෝජනාවක් මහා සභා රැස්වීමකට ඉදිරිපත් කළ යුතුය. මහා සභාවේ අනුමැතිය මත එවැනි අයෙකුට සම්මාන හෝ ගෞරව සේවා සාමාජිකත්වය පිරිනැමීමෙන් පසු ඔවුන්ගේ නම් සාමාජික නාම ලේඛනයේ ඇතුළත් කළ යුතුය. |
| 7.3 | | 7.3 | "ඡයාරූපය පාස්පෝට් ප්‍රමාණයේ විය යුතුය." යන්න ඉවත් කර ඇත. |
| 7.4 | | 7.4 | යාවජීව සහ සාමාන්‍ය සාමාජිකත්වයක් සඳහා අයදුම් කරනු ලබන සෑම අයෙකුම අයදුම්පත අනුමත වූ පසුව තත් වර්ෂයට නියමිත සාමාජික මුදල්ද ගෙවිය යුතුය. |
| 7.5 | | | ඉවත් කර ඇත. |
| 7.6 | | | 7.5 ලෙස අංකනය වී ඇත. |
| 9 | | 9<br>9.4 | සාමාජිකත්ව අහෝසි වීම.<br>විනයානුකූල පියවර ගැනීම<br>ශීර්ෂ දෙකක් යටතේ දක්වා ඇත. |
| 9.2 | | 9.2 | එවන් පුද්ගලයෙකුට මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව නව අයදුම් පතක් ඉදිරිපත් කිරීමෙන්, නව අංකයක් යටතේ සාමාජිකත්වය ලබාගත හැකිය.<br>( මෙම කොටස අවසන් වගන්තිය ලෙස ඇතුළත් කර ඇත.) |
| 9.3 | | 9.4 | පෙර 9.3 ඉවත් කර ඇත. ඒ අනුව අංකනය වෙනස් වී ඇත. |
| 9.5 | | 9.4.1 | අංකය වෙනස් වී ඇත. |
| 9.6 සිට 9.6.6 | විනයානුකූල පියවර ගැනීම | 9.4.1 - 9.4.10 ලෙස දක්වා ඇත. | නව වගන්ති ද ඇතුළත් කර සංශෝධනය කර ඇත |
| 9.6 | | 9.4.2 | යම් සාමාජිකයෙකු සංගමයේ ව්‍යවස්ථාවට, කීර්තිනාමයට හා පරමාර්ථවලට පටහැනි වන ආකාරයට ක්‍රියාකරන බව හෝ සංගමයේ ගෞරවයට හානි වන පරිද්දෙන් ක්‍රියාකල හෝ කරන බව හෝ සංගමයේ දේපළ අයථා ලෙස පාවිච්චි කරන හෝ කළ බව හෝ සංගමයේ මුදල් අයථා ලෙස පරිහරණය/වංචා කරන හෝ කළ බැව් දැනගත් අවස්ථාවකදී ඒ සම්බන්ධව ලිඛිතව ප්‍රධාන ලේකම් හෝ සභාපති වෙත වාර්තා කිරීමේ අයිතිය සාමාජිකයන් සතු වේ. එවන් ඉදිරිපත් කිරීමක් අවම වශයෙන් සාමාජිකයන් 10 දෙනෙකුගේ අත්සනින් ඔවුන්ගේ නම් සහ සාමාජික අංක පැහැදිලිව සටහන් කර, පැමිණිල්ල සනාථ කිරීමේ කරුණු සහිතව විධායක සභාවට ඉදිරිපත් කළ යුතු අතර එම පැමිණිල්ල පිළිබඳ මූලික විමර්ශනයක් සිදුකිරීමෙන් අනතුරුව පහත සඳහන් පියවර ගැනීමේ අයිතිය විධායක සභාව සතුය. නිර්නාමික පැමිණිලි කිසිදු විමර්ශනයකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. |
| 9.6.1 | | 9.4.3 | මූලික විමර්ශනය මත ගොනු කරන ලද චෝදනා පත්‍රයක් සංගමයේ ප්‍රධාන ලේකම් විසින් අදාළ සාමාජිකයාට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර ඒ සඳහා නිදහසට කරුණු එම ලිපිය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය යුතුය. එම කාල සීමාව තුළ පිළිතුරු නොලද හොත් අදාළ සාමාජිකයා වරද පිළිගෙන ඇති බැව් සලකා මෙම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව විනයානුකූලව පියවර ගැනීමේ අයිතිය විධායක සභාව සතුවේ. අදාළ සාමාජිකයා විදේශගත වීම, අසනීප තත්ත්වයක් හෝ විධායක සභාවට පිළිගත හැකි සාධාරණ හේතුවක් මත ඉහත සඳහන් දින 30 කාලසීමාව දීර්ඝ කිරීමේ බලය විධායක සභාව සතුවේ. පැමිණිල්ල ලැබී ඇත්තේ විධායක සභිකයෙකුට විරුද්ධව නම් එම පැමිණිල්ල සාකච්ජා කරන රැස්වීම් වලට ඔහුට සහභාගි විය නොහැක. |
| 9.6.2 | | 9.4.4 | එම චෝදනා පත්‍රයට පිළිතුරු ලැබුණු පසු අදාළ සමාජිකයා විසින් නිදහසට දී ඇති කරුණු සලකා බැලීම පිණිස එළඹෙන දින 30 ඉකුත් වීමට පෙර විනය පරීක්ෂණ මණ්ඩලයට යොමු කළ යුතු වේ. එම පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටීමට අදාළ සාමාජිකයාට පමණක් අයිතිවාසිකම් ලැබෙන අතර පරීක්ෂණ කමිටුව |

| | | | |
|---|---|---|---|
| | | | ඉදිරියේ පෙනී සිටින ලෙස අදාල සාමාජිකයාට පරීක්ෂණය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 07 කට පෙර ලිඛිත දැනුම් දීමක් කළ යුතුය. පරීක්ෂණයට ඉදිරිපත් නොවුවහොත් අදාළ සාමාජිකයා වරද පිළිගෙන ඇති බැව් සලකා මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව විනයානුකූල පියවර ගැනීමේ බලය විධායක සභාව සතු වේ. |
| 9.6.3 | | 9.4.5 | විනය පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය ඃ සෑම වර්ෂයකම මහා සභා රැස්වීමේදී සාමාජිකයින්ගේ අනුමැතිය සහිතව එළඹෙන පරිපාලන වර්ෂය සඳහා විනය පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ගත යුතුය. මෙම කාර්යය සඳහා සුදුසුකම් හා නිපුණත්වයක් ඇතැයි විධායක සභාව පිළිගන්නා සාමාජිකයින් හත් දෙනෙකු (7) නිර්දේශ කිරීම විධායක සභාවේ කාර්යභාරය වේ.නිර්දේශ කිරීමට ප්‍රථම අදාළ සාමාජිකයින්ගේ කැමැත්ත ලබාගත යුතුය. අදාළ වර්ෂයේ විධායක සභිකයින් කිසිවකු විනය පරීක්ෂණ මණ්ඩලයට ඇතුලත් නොවිය යුතුය. තත්කාලීන විධායක සභාවේ ලේකම්ට හෝ වෙනත් උසස් නිලධාරියෙකුට පරීක්ෂණ මණ්ඩලයේ ඉල්ලීම මත ඔවුන්ගේ කටයුතුවලට සහාය දීම සඳහා සහභාගි විය හැක. විනය පරීක්ෂණ මණ්ඩලයේ ගණ පූරණය තුනකි (3). උපරිම ධූර කාලය ප්‍රථම වරට පත්වූ දින සිට වසර තුනකි. |
| 9.6.4 | | 9.4.6 | විනය පරීක්ෂණ මණ්ඩලයේ බහුතර කැමැත්ත මත පහත සඳහන් ක්‍රියාමාර්ගවලින් එකක් හෝ කීපයක් එකවර නිර්දේශ කිරීමට විනය පරීක්ෂණ මණ්ඩලයට බලය තිබේ. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ බලය විධායක සභාව සතු වේ.<br>i. සාමාජිකයා නිදහස් කිරීම.<br>ii. සාමාජිකයාට අවවාද කිරීම,<br>iii.වරදේ ස්වභාවය අනුව නිශ්චිත කාලයකට සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටවනු ලැබීම,<br>iv. එළඹෙන මහා සභාවේ අනුමැතියට යටත්ව සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි කිරීම,<br>v. සිදුවී ඇති මූල්‍යමය අලාභයන් අය කර ගැනීම,<br>vi. සාමාජිකයාට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීම,<br>vii.සංගමයේ දරන තනතුරුවලින් ඉවත් කිරීම. |
| 9.6.5 හා 9.6.6 | වෙනුවට | 9.4.7/9.4.8 9.4.9/9.4.10 | නව වගන්ති ලෙස ඇතුලත් කර ඇත. |
| | | 9.4.7 | ඉහත 9.4.6 iii – vii දක්වා සඳහන් කර ඇති විනය ක්‍රියාමාර්ගයකට ලක්වූ සාමාජිකයෙකු හට සංගමයේ ප්‍රධාන ලේකම් මගින් අනුශාසක මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එවන් අභියාචනයක් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ප්‍රධාන ලේකම් විසින් එය අනුශාසක මණ්ඩලය වෙත යොමු කළ බැව් සනාථ කොට ලියාපදිංචි තැපැල් මගින් සාමාජිකයා දැනුවත් කළ යුතුය. අනුශාසක මණ්ඩලය විසින් මාස දෙකකට නොවැඩි කාලසීමාවක් තුළදී අභියාචනය විමර්ශනයට භාජන කර බහුතර කැමැත්තෙන් තීරණයක් ලබාදිය යුතු අතර එම තීරණය අදාළ විනය කරුණ සම්බන්ධයෙන් අවසන් තීරණය වේ.<br><br>9.4.6 (iv) සඳහන් පරිදි සාමාජිකත්වය අහෝසි කිරීමට අභියාචනා මණ්ඩලය විසින් ද නිර්දේශ කළහොත් එම නිර්දේශය එළඹෙන මහා සභාවට ඉදිරිපත් කර සාමාජිකයින්ගේ බහුතර කැමැත්තෙන් තීරණයක් ගත යුතුය. |
| | | 9.4.8 | සංගමය සතු මුදල් වංචා කිරීම, අපහරණය කිරීම, අනුමත මූල්‍ය ප්‍රතිපත්ති චේතානාන්විතව උල්ලංඝනය කිරිම හෝ සංගමයට මූල්‍යමය වශයෙන් අලාභයක් සිදුවන පරිදි චේතානාන්විතව කටයුතු කිරීම යන කරුණු මත විනය පරීක්ෂණමණ්ඩලයකින් වරදකරු කර ඇති කිසියම් සාමාජිකයෙකු විධායක සභාවේ කිසිදු නිලයකට ඉල්ලුම් කිරීමට හෝ විධායක සභාව හෝ කළමනාකරණ |

| | | | |
|---|---|---|---|
| | | | මණ්ඩලය හෝ නියෝජනය කිරීමට කිසිසේත් සුදුසු කම් නොලබයි. |
| | | 9.4.9 | 9.4.2 වගන්තියේ දක්වා ඇති වෙනත් විනය විරෝධී ක්‍රියාවකට වරදකරු වී ඉහත 9.4.6 වගන්තියේ iii සිට vii දක්වා ( iv හැර) ක්‍රියාමාර්ග එකක් හෝ කිහිපයක් නියම වී ඇති කිසිවෙක් දඬුවම ගෙවා වසර 03ක කාලයක් යනතුරු විධායක සභාවේ හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ කිසිදු නිලයක් දැරීමට හෝ විධායක සභාව හෝ කළමනාකරණ මණ්ඩලය හෝ නියෝජනය කිරීමට සුදුසුකම් නොලබයි. |
| | | 9.4.10 | ඉහත අංක 9.4.8 හා 9.4.9 න් ප්‍රකාශිත කිසිදු පුද්ගලයෙකු ඉදිරිපත් කරන නාම යෝජනා පත්‍රයක් වේනොත් එය ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ බලය නාම යෝජනා මණ්ඩලය සතු වේ. නාම යෝජනා මණ්ඩලයට අනාවරණය නොවීම නිසා එවැන්නෙකු තේරී පත් වුවහොත් එය අනාවරණය වූ වහාම ඔහුගේ සභික ධූරය අහෝසි කර සියලු තනතුරු වලින් ඉවත් කිරීමේ අයිතිය විධායක සභාව සතුය. |
| 10.1 සිට 10.17 වෙනුවට | වසර කණ්ඩායම්, දශක කණ්ඩායම් සහ අනුබද්ධිත සංවිධාන | 10.1 සිට 10.18 දක්වා වගන්ති | දශක කණ්ඩායම් සහ අනුබද්ධිත සංවිධාන<br>(බොහෝ සෙයින් සංශෝධනය වී ඇති හෙයින් මුලු පර්ච්ඡේදයම දක්වා ඇත.) |
| 10.1 | | 10.1 | සංගමයේ පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා දස වසරකට එක බැගින් දශක කණ්ඩායම් හෝ පහත සඳහන් උද්ධෘතයන් යටතේ අනුබද්ධිත සංවිධාන බිහි කළ හැකිය.<br>– විදේශීය සහ ප්‍රාදේශීය<br>– වෘත්තීය<br>– ක්‍රීඩා/නායකත්ව<br>– සංස්කෘතික හා සුල සාධන<br>– ආදි ශිෂ්‍ය දෙමවුපිය |
| 10.2 | | 10.2 | ඉහත සඳහන් කණ්ඩායම් හෝ සංවිධාන සඳහා පළමුව වසර දෙකක තාවකාලික සාමාජිකත්වයක් ලබාගත හැකි අතර වසර දෙකක ක්‍රියාකාරිත්වයෙන් පසු පූර්ණ සාමාජිකත්වය සඳහා විධායක සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. අවම සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට විධායක සභාව සෑහීමකට පත්වේ නම් පූර්ණ සාමාජිකත්වය පිරිනැමිය හැකිය. දැනට සාමාජිකත්වය ලබා ඇති කණ්ඩායම්වලට සහ සංවිධානවලට මෙම වගන්තිය බල නොපැවැත්වේ. |
| 10.3 | ඉවත් කර ඇත | | |
| 10.4 | | 10.3 | දශක කණ්ඩායම් පිළිගැනීම සඳහා අවම වශයෙන් ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය දරන 35 දෙනෙකු එම කණ්ඩායමේ සාමාජිකත්වය දැරිය යුතුය. |
| | | 10.4 නව වගන්තියකි | එක් දශකයක් සඳහා කණ්ඩායමක් බිහිකර ආදි ශිෂ්‍ය සංගමයේ පූර්ණ සාමාජිකත්වය ලබාගත් පසු එම කණ්ඩායමේ සාමාජිකයින් හට ඔවුන්ගෙන් එක් එක් වසර සඳහා වෙන වෙනම සංවිධාන පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. |
| | | 10.5 නව වගන්තියකි | දශකයකට වඩා වැඩි කාල සීමාවක් ආවරණය වන සේ පිහිටුවා දැනට ආදි ශිෂ්‍ය සංගමයේ පිළිගැනීමට ලක්වී ඇති ''මුල්පෙළ පාලියෝ කණ්ඩායම'' ඒ ලෙසම ක්‍රියාත්මක වෙනු ඇත. |
| 10.7 | | 10.6 | දශක කණ්ඩායම් සහ ආදි ශිෂ්‍ය සංගමය අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාම සඳහා එම කණ්ඩායම්වල ගරු සභාපති සහ ගරු ලේකම් නිල බලයෙන් ආදි ශිෂ්‍ය සංගමයේ විධායක කමිටුවට ඇතුළත් වේ. යම්කිසි සභා වාරයකට එම නිලධාරීන් ගෙන් අයෙකුට හෝ දෙදෙනාටම සහභාගි විය නොහැකි අවස්ථාවල දී ඔහු හෝ |

| | | | |
|---|---|---|---|
| | | | ඔවුන් නියෝජනය කිරීම පිණිස අදාළ දශක කණ්ඩායමේ වෙනත් නිල දරන්නෙකු නම් කළ හැකි අතර ඒ පිළිබඳව සංගමයේ ප්‍රධාන ලේකම් වෙත පූර්ව දැනුම්දීමක් කළ යුතුය. එසේ වුවද පරිපාලන වර්ෂයේ පැවැත්වෙන මුළු රැස්වීම් සංඛ්‍යාවෙන් අවම වශයෙන් අඩකට (50%) සභාපති/ලේකම් සහභාගී වීම අනිවාර්ය වේ. |
| 10.4 | | 10.7 | අනුබද්ධ සංවිධානයන් බිහිකිරීම සඳහා අවම වශයෙන් සාමාජිකයින් 25 දෙනෙකු එකී සංවිධානයේ සාමාජිකත්වය ලබා තිබිය යුතුය. |
| | | 10.8 නව වගන්තියකි | 10.1 වගන්තියෙන් සඳහන් නොවන වෙනත් විෂය ක්ෂේත්‍රයක් යටතේ අනුබද්ධිත සංවිධාන සඳහා ආදි ශිෂ්‍ය සංගමයේ විධායක මණ්ඩලයේ තුනෙන් දෙකක (2/3) අනුමැතියකින් අනුබද්ධිත සංවිධාන තත්ත්වය ප්‍රදානය කළ හැකි අතර ඊට අදාළ නිර්ණායක කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ මත විධායක සභාවට තීරණය කළ හැකිය. |
| 10.5 | | 10.9 | ප්‍රාදේශීය වශයෙන් පිහිටුවන අනුබද්ධිත සංවිධාන පරිපාලන දිස්ත්‍රික්කයට එකක් පමණක් විය යුතුය. |
| | | 10.10 නව වගන්තියකි | අනුබද්ධිත සංවිධානයන්හි වැඩ කටයුතු සහ සංගමයේ වැඩ කටයුතු සම්බන්ධීකරණය සංගමයේ සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ සුභසාධන කටයුතු භාර උපසභාපතිවරයා විසින් පවත්වාගෙන යා යුතු අතර, අනුබද්ධිත සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්තාවක් මාස තුනකට වරක් ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභා රැස්වීමට ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය. විධායක සභාව දැනුවත් කළ යුතු කරුණක් උදෙසා පූර්ව දැනුම් දීමකින් පසු හෝ විධායක සභාවේ ආරාධනාවෙන් යම්කිසි විධායක සභා රැස්වීමකට සහභාගීවීමට අනුබද්ධිත කණ්ඩායමක සභාපති/ලේකම් හෝ වෙනත් නිලධාරියෙකුට හැකිවනු ඇත. |
| 10.6 | | 10.11 | එක් එක් දශක කණ්ඩායම් සහ අනුබද්ධිත සංවිධාන සංගමයේ විධායක සභාව විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාවක් යටතේ කටයුතු කළ යුතුය. එහි නිල දරන්නන් ලෙස ගරු සභාපති වරයෙකු, ගරු ලේකම්වරයෙකු, ගරු සංස්කාරකවරයෙකු සහ ගරු භාණ්ඩාගාරිකවරයෙකු අවම වශයෙන් සිටිය යුතු අතර එම නිලධාරීන් සහ සාමාජිකයින් අතරින් තෝරා පත්කරගත් කාරක සභාවක් මගින් එහි කටයුතු මෙහෙයවීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය. එසේ කළ නොහැකි අවස්ථා වලදී එහි සංයුතිය තීරණය කිරීමේ බලය ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාව සතු වේ. කිසිදු දශක හෝ අනුබද්ධිත සංවිධානයක් සඳහා නිලධාරීන් පත් කිරීම සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී සිදු නොකෙරේ. එක් එක් දශක කණ්ඩායම් සහ අනුබද්ධිත සංවිධාන සතු ව්‍යවස්ථාව සංශෝධන වන අවස්ථාවලදී අදාළ සංශෝධන සිදුකර මාස 02 ක් ඇතුළත සංශෝධිත ව්‍යවස්ථාව නිසි පරිදි විධායක සභාව වෙත ලබා දිය යුතුය. |
| 10.8 | | 10.12 | සියලු දශක කණ්ඩායම් සහ අනුබද්ධිත සංවිධාන විසින් එහි සාමාජිකයින්ට පමණක් සීමා වූ වැඩ මාලාවක් සහ අරමුදල් එකතු කිරීම සඳහා වූ ව්‍යාපෘති ස්වාධීනව සංවිධානය කිරීමේ නිදහස තිබෙන අතර සංගමයේ නාමය යටතේ මහජනයාගේ හෝ විදුහලේ ආචාර්ය මණ්ඩලය හෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගිත්වය සහිතව දියත් කිරීමට බලාපොරොත්තු වන්නාවූ වැඩ මාලාවක්/ව්‍යාපෘතියක් සඳහා විධායක කමිටුවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| 10.9 | | 10.13 | සංගමයේ විධායක කමිටුවේ තීරණයක් මත<br>I. දශක හෝ අනුබද්ධිත සංවිධානවල විශේෂ කාරක සභා හෝ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමේ බලය හෝ/සහ<br>II. එම සංවිධාන වල ගිණුම් පොත් පරීක්ෂා කර බැලීම සඳහා පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් පත් කිරීමේ බලය සංගමය සතු වේ. |
| 10.10 | | 10.14 | සෑම පරිපාලන වර්ෂයකම ඒ ඒ දශක කණ්ඩායම් සහ අනුබද්ධිත සංවිධාන විසින් එම වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට තීරණය කර |

| | | | |
|---|---|---|---|
| | | | ඇති වැඩසටහන සංගමයේ අනුමැතිය සඳහා සංගමයේ ගරු ප්‍රධාන ලේකම් වෙත අදාළ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා මාසයක් ඇතුළත එවිය යුතුය. |
| 10.11 | | 10.15 | සෑම දශක සහ අනුබද්ධිත සංවිධානයකම මුදල් වර්ෂය ජනවාරි 01 දිනෙන් ආරම්භ වී එම වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය යුතුය. එසේම පරිපාලන වර්ෂය සෑම වර්ෂයකම මාර්තු 01 දිනෙන් ආරම්භ වී ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනෙන් අවසන් විය යුතුය. සියලුම දශක සහ අනුබද්ධිත සංවිධාන වල වාර්ෂික මහා සභා රැස්වීම් වර්ෂයේ ජනවාරි 01 දින සහ පෙබරවාරි 28 යන කාලය තුළ පවත්වා අවසන් කළ යුතුය. |
| | | 10.16 නව වගන්තියකි | සෑම දශක සහ අනුබද්ධිත සංවිධානයක්ම සංගමය විසින් ලබාදෙන සේවාවන් සහ පහසුකම් භාවිත කිරීම වෙනුවෙන් විධායක සභාව මගින් අනුමත කරන ලද පරිපාලන ගාස්තුවක් සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 31 දිනයට පෙර ගෙවිය යුතුය. පරිපාලන වියදම්වලට අනුකූලව එම මුදල තීරණය කිරීමේ සහ සංශෝධන කිරීමේ බලය විධායක සභාව සතු වේ. |
| | | 10.17 නව වගන්තියකි | සෑම වසරකම පෙබරවාරි මස අවසන් වීමට පෙර ඉහත සංවිධානයන්හි ගෙවී ගිය වසරේ කටයුතු ගැන සවිස්තරාත්මක වාර්තාවක් සහ වාර්ෂික ගිණුම් වාර්තාවක් සංගමය වෙත ඉදිරිපත් කළ යුතුය. දශක කණ්ඩායම්වල වාර්ෂික ගිණුම් විගණනය එම කණ්ඩායම විසින් පත් කර ගනු ලබන විගණකවරුන් විසින් සිදුකළ යුතු අතර එම ගිණුම් ආදි ශිෂ්‍ය සංගමයේ ගිණුම් වාර්තා සමග ඒකාබද්ධ කළ යුතුය. |
| 10.17 | | 10.18 | ඉහත 10.1 සිට 10.16 දක්වා වූ විධිවිධාන වලට අනුකූලව කටයුතු නොකරන කණ්ඩායම් නිසි මගට යොමු කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ බලය විධායක සභාව සතු වන්නේය. |
| V. | විධායක සභාවේ ව්‍යුහය | V. | විධායක සභාව හා අනුශාසක මණ්ඩලය |
| 12 | | 12 | අනුශාසක මණ්ඩලය<br>විධායක සභිකයින් නොවන යම් ක්ෂේත්‍රයක ප්‍රවීණත්වයට පත්ව ඇති සුවිශේෂී ආදි ධර්මපාලයීයන් පස් දෙනෙකුගෙන් (5) අනුශාසක මණ්ඩලය සමන්විත වනු ඇත. එම සාමාජිකයින් පස්දෙනා විධායක සභාවේ නිර්දේශය මත සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී සාමාජිකයින්ගේ අනුමැතිය සහිතව පත් කර ගත යුතුය.ඔවුන්ගේ ධුර කාලය එක් පරිපාලන වර්ෂයක් වන අතර ධුරයේ රැඳී සිටිය හැකි උපරිම කාලය වසර 03 කි. දෙවසරක විරාමයෙන් පසු නැවතත් පත් කර ගත හැකිය. |
| | | 12.3 නව වගන්තියකි | සංගමයේ සියලු විධායක සභා රැස්වීම් වාර්තා සහ සියලු මහා සභා රැස්වීම් වාර්තා අනුශාසකවරුන්ට ලැබීමට සැලැස්විය යුතුය. |
| | | 12.4 | නව වගන්ති (අනුශාසක මණ්ඩලයේ රැස්වීම් හා කාර්ය භාරය) |
| | | 12.4.1 | මෙම මණ්ඩලය නව විධායක සභාවක් පත්වී මාස තුනක් ඇතුළත දී රැස්විය යුතු අතර එම රැස්වීම තත්කාලීන ප්‍රධාන ලේකම්වරයා විසින් කැඳවිය යුතුය. එහිදී සංගමයේ වර්තමාන ක්‍රියාවලිය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සිදු කෙරෙනු ඇත. ඉන් පසුව අවශ්‍ය අවස්ථාවලදී රැස්විය හැකිය. රැස්වීම්වලදී ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකි. |
| | | 12.4.2 | කාර්යභාරය |
| 12.3 | | 12.4.2.1. | සංගමයේ කටයුතු ව්‍යවස්ථානුකූලව සිදුවන බැව් අධීක්ෂණය කිරීම සහ සංගමයේ කටයුතු ව්‍යවස්ථාවට පටහැනිව සිදුවන විට ඒ පිළිබඳව සංගමය, විධායක සභාව හෝ කළමනාකරණ මණ්ඩලය දැනුවත් කිරීම සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම. |
| | | 12.4.2.2. | සංගමයේ හෝ ධර්මපාල විද්‍යාලයේ පැවැත්ම අභිවෘද්ධියට අදාළ කටයුත්තකදී සහ/හෝ සංගමයේ සභාපති, විධායක සභාපති, විධායක සභාවේ සාමාජිකයින් සහ/හෝ කළමනාකරණ මණ්ඩලයේ සෙසු සාමාජිකයින් අතර මත එකඟතාවයක් නොමැති වෙනත් කටයුත්තකදී සභාපතිවරයාට සහ/හෝ කළමනාකරණ මණ්ඩලයට/විධායක සභාවට උපදෙස් දීම. |

| | | | |
|---|---|---|---|
| | | 12.4.2.3 | විනය පරීක්ෂණයකදී අභියාචනා මණ්ඩලය ලෙස කටයුතු කිරීම. |
| | | 12.4.2.4 | නාම යෝජනා පිරික්සුම් කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කිරීම. |
| 13 | විධායක සභාව සහ කෘත්‍යාධිකාරි මණ්ඩලය | 13 හා 13.12 ලෙස කොටස් දෙකක් යටතේ ඇතුලත් වී ඇත. | 13 පරිච්ඡේදය බොහෝ සෙයින් සංශෝධනය වී ඇති හෙයින් මුලු පරිච්ඡේදයම දක්වා ඇත.<br>13.විධායක සභාව ලෙසත්<br>13.12 කෘත්‍යාධිකාරි මණ්ඩලය කළමණාකරණ මණ්ඩලය ලෙස සංශෝධනය කර ඇත. |
| 13 | විධායක සභාව සහ කළමණාකරන මණ්ඩලය | 13 | විධායක සභාව -<br>විධායක සභාවේ සේවය ගෙවීමකින්, පෞද්ගලික ලාභ හෝ වරප්‍රසාද අපේක්ෂාවකින් තොර එකක් වන්නේය. |
| 13.1 | | 13.1 | **13.1 විධායක සභාවේ සංයුතිය**<br>**නිලය තනතුරු ගණන**<br>13.1.1 සභාපති (තත්කාලීන විදුහල්පති) (01)<br>13.1.2 විධායක සභාපති (01)<br>13.1.3 ප්‍රධාන ලේකම් (01)<br>13.1.4 (1) නියෝජ්‍ය සභාපති (01)<br>(2) උප සභාපති (03)<br>13.1.5 පසුගිය වාරයේ විධායක සභාපති ධූරය දරන ලද ඉවත්ව ගිය නිලධාරියා (නිල බලයෙන්) (01)<br>13.1.6 (1) නියෝජ්‍ය ලේකම් (01)<br>(2) උප ලේකම්වරු (01)<br>13.1.7 (1) භාණ්ඩාගාරික (01)<br>(2) උප භාණ්ඩාගාරික (01)<br>13.1.8 (1) සංස්කාරක (01)<br>(2) උප සංස්කාරක (01)<br>(වාර්ෂික මහා සභාවේදී පත්වන විධායක කාරක සභිකයන්ගෙන් එක් අයෙක්)<br>13.1.9 කාරක සභිකවරු<br>(1) වාර්ෂික මහා සභා රැස්වීමේදී තේරීපත්වන සාමාජිකයින් (11)<br>(2) එක් එක් දශක කණ්ඩායමෙන් සාමාජිකයින් 2 බැගින් (12)<br>(10.6 වගන්තියට අනුව)<br>(3) විධායක සභාව විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයින් (03)<br>**එකතුව** **(39)** |
| | | 13.1.10 | ඉහත 13.1.9.1 යටතේ තේරීපත් වනකිසිදු සභිකයකු අදාළ වර්ෂයේ කිසිදු දශක කණ්ඩායමක විධායක සභාව නියෝජනය නොකළ යුතුය. ඉහත 13.1.9.1 යටතේ තේරී පත්වන සාමාජිකයින් අවම වශයෙන් වසර 02 කාලයක් තම තමන්ගේ දශක කණ්ඩායම්වල කාරක සභිකයෙකු/නිලධාරියකු ලෙස කටයුතු කර තිබිය යුතුය. සෙසු නිලධාරීන් තත් කාලීන වර්ෂයේ කිසිදු දශක කණ්ඩායමක නිලධාරීන් නොවිය යුතුය. |
| | | **13.2** | **ගරු සභාපති**<br>ධර්මපාල විද්‍යාලයේ තත්කාලීන විදුහල්පති නිල බලයෙන් සභාපති ධූරයට පත් වේ. |
| 13.1.8 | | **13.3** | **ගරු විධායක සභාපති**<br>ආදි ශිෂ්‍ය සංගමයේ වැඩකටයුතු මනා ලෙස පරිපාලනය කර මෙහෙයවීම පිණිස සංගමය මගින් වාර්ෂික මහා සභා රැස්වීමේදී ගරු විධායක සභාපතිවරයෙකු පත් කර ගත යුතුය. එසේ පත් කරගන්නා විධායක සභාපතිවරයා අවම වශයෙන් වසර 12ක් ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය සම්පූර්ණ කරන ලද, වගකීමක් දැරිය |

| | | | |
|---|---|---|---|
| | | | හැකි පුද්ගලයෙකු ලෙස සමාජයේ පිළිගැනීමක් ඇති, ගරු අනුශාසක වරයෙකු හෝ අවම වශයෙන් ආදි ශිෂ්‍ය සංගමයේ කාරක සභිකයෙකු ලෙස වසර දෙකක් (02) සහ නිලධාරියෙකු ලෙස වසර දෙකක් (02) කටයුතු කර ඇති ආදි ශිෂ්‍යයකු විය යුතුය. දශක කණ්ඩායමක සභාපති හෝ ලේකම් ධුරය දරන තැනැත්තෙකු සංගමයේ විධායක සභාපති පදවියට පත් වුවහොත් එම හේතුව නිසා ඔහුගේ දශක කණ්ඩායමේ ධුරය අහෝසි වනු ඇත. |
| 13.1.10 | | **13.4** | **ගරු ප්‍රධාන ලේකම්**<br>අවම වශයෙන් ආදි ශිෂ්‍ය සංගමයේ වසර 8 ක සාමාජිකත්වයක් සම්පූර්ණ කරන ලද සහ අවම වශයෙන් වසර 04 ක් ආදි ශිෂ්‍ය සංගමයේ කාරක සභිකයෙකු හෝ නිලධාරියෙකු ලෙස කටයුතු කර ඇති ගරු ප්‍රධාන ලේකම් ධුරයේ වගකීම දැරිය හැකි මෙන්ම ඒ සඳහා අවශ්‍ය කාලය මිඩංගු කළ හැකි සාමාජිකයෙකු විය යුතුය. |
| 13.1.9 | | **13.5** | **ගරු නියෝජ්‍ය සභාපති**<br>ඉහත 13.3 සඳහන් සුදුසුකම් සපුරා ඇති අයෙකු විය යුතුය. |
| | | **13.6** | **භාණ්ඩාගාරික**<br>මූල්‍ය විෂය පිළිබඳ දැනුමක් සහිත හෝ තමා නියැළී සිටින වෘත්තිය හේතුවෙන් මූල්‍ය කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති විශ්වසනීය අයෙක් විය යුතුය. ඔහු පසුගිය ආසන්නතම වසර **05** ක් ඇතුළත අවම වශයෙන් එක් වතාවක් හෝ විධායක සභාව නියෝජනය කළ අයෙක් විය යුතුය. දශක කණ්ඩායමක හෝ අනුබද්ධිත කණ්ඩායමක භාණ්ඩාගාරික ධුරය සංගමයේ භාණ්ඩාගාරික විසින් නොදැරිය යුතුය. |
| | | **13.7** | පළාත් පාලන/ප්‍රාදේශිය සභා, පළාත් සභා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් හෝ පිළිගත් දේශපාලන පක්ෂයක ප්‍රධාන නිලයක් දරන කිසිවෙකු ඉහත 13.3 සිට 13.6 දක්වා සඳහන් තනතුරු කිසිවක් දැරීමට සුදුසු නොවේ. ඉහත සඳහන් යම් තනතුරක් දරමින් සිටින අවස්ථාවක එවැනි තත්ත්වයකට පත් වූයේ නම් එසේ පත්වූ විගස එම තනතුර අහෝසි වේ. |
| 13.1.11 | | **13.8** | **සෙසු නිලධාරීන් සහ සභිකයින්** |
| 13.1.11.1 | | 13.8.1 | ඉහත 13.3 සිට 13.6 දක්වා ඇති වගන්තිවලට යටත්ව විධායක සභාව සඳහා වාර්ෂික මහා සභාවකදී පත් කර ගන්නා සාමාජිකයින් අවම වශයෙන් වසර දෙකක ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වයක් සම්පූර්ණ කර සිටිය යුතුය. |
| 13.1.11.2 | | 13.8.2 | ඉහත දැක්වූ 13.1.2 සිට 13.1.9 දක්වා වූ තනතුරුවලට 13.1.2, 13.1.5, 13.1.8 (2), 13.1.9 (2) සහ 13.1.9 (3) හැර ව්‍යවස්ථාවේ 19 වෙනි ඡේදයට අනුකූලව නාම යෝජනා කැඳවීමෙන් පසුව වාර්ෂික මහා සභා රැස්වීමේදී සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් පත් කර ගත යුතු වේ. |
| | | 13.8.3 | ඉහත 13.1.8 (2) යටතේ සඳහන් උප සංස්කාරක 13.1.9 (1) යටතේ පත්වන කාරක සභිකවරුන් එකළොස්දෙනා (11) අතරින් තෝරාපත් කරගත යුතුය. එම පත්වීම වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසුව එළඹෙන ප්‍රථම විධායක සභා රැස්වීමේදී සිදු කළ යුතුය. |
| | | 13.8.4 | 13.1.9. (2) හි සඳහන් කාරක සභික වරුන් දොළොස් දෙනා (12) එක් එක් දශක කණ්ඩායමකින් සභාපති හා ලේකම් බැගින් විය යුතුය. |
| 13.1.11.3 | | 13.8.5 | ඉහත 13.1.9. (3) හි දැක්වෙන කාරක සභිකවරු තිදෙනා (3) වාර්ෂික මහා සභා රැස්වීමට පසුව එළඹෙන ප්‍රථම විධායක සභා රැස්වීමේදී තෝරා පත්කර ගත යුතුය. එම සාමාජිකයින් තිදෙනා විවිධක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන පරිදි ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් අතරින් පත් කර ගත යුතුය. |
| | | **13.9** | **නිල කාලය** |
| 13.1.12 | | 13.9.1 | සියලුම විධායක සභිකයින්ගේ පත්වීම් එක් වාර්ෂික මහා සභා රැස්වීමක සිට අනෙක් මහා සභා රැස්වීම දක්වා පමණක් වලංගුවේ. |

| | | | |
|---|---|---|---|
| 13.1.14.1 | | 13.9.2 | විධායක සභාපතිවරයාගේ සහ නියෝජ්‍ය සභාපතිවරයාගේ නිල කාලය වසර එකකි. වරින් වර එක් තනතුරක් දැරිය හැකි උපරිම අවස්ථා ගණන තුනකට සීමා වේ. |
| 13.1.14.2 | | 13.9.3 | තත් වර්ෂයේ නියෝජ්‍ය සභාපතිවරයා ඉදිරි වර්ෂයේ විධායක සභාපති ලෙස නිතරගයෙන් පත්වීමට හිමිකම් ලබයි. එසේවුවද, යම් හෙයකින් විධායක සභාපතිවරයාගේ නිල කාලය අවසාන වන අවස්ථාවේදී පසුගිය වාර්ෂික මහා සභාවෙන් පත්කර ගන්නා ලද නියෝජ්‍ය සභාපතිවරයා ඉදිරි වර්ෂයේ විධායක සභාපතිත්වය සඳහා ඉදිරිපත් නොවන්නේ නම් හෝ ව්‍යවස්ථානුකුලව ඉදිරිපත් විය නොහැකි නම් නාම යෝජනා කැඳවීමේ ලිපිය සාමාජිකයින් වෙත යැවීමට ප්‍රථම ඔහු ඒ බැව් විධායක සභාව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. එවන් අවස්ථාවකදී පමණක් විධායක සභාපති සහ නියෝජ්‍ය සභාපති යන තනතුරු ද්විත්වය සඳහාම නාම යෝජනා කැඳවනු ලැබේ. |
| 13.1.15 | | 13.9.4 | ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ලේකම්, උප සභාපති, භාණ්ඩාගාරික ධූරයන් සඳහා අඛණ්ඩව වසර දෙකක් තේරීපත් විය හැක. වසරක විරාමයෙන් පසු නැවත එම ධූර සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ හැකිය. |
| | | **13.10** | **විධායක සභාවේ බලතල** |
| 13.2.1 | | 13.10.1 | සංගමයේ පරිපාලන කටයුතු සහ එහි අරමුණු සාධනය සම්බන්ධ වන සියලුම ආකාරයේ කරුණු පිළිබඳවත්,එබඳු පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය වන මුදලක් සංගමයේ අරමුදල්වලින් වියදම් කිරීම පිළිබඳවත්, යථෝක්ත සියලුම කටයුතු පාලනය කිරීම, මෙහෙයවීම, තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ බලය හා අධිකාරිය මෙන්ම පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය රීති සම්පාදනය කිරීමේ බලය ද විධායක සභාව සතු වන්නේය. |
| 13.2.2 | | **13.10.2** | **අනු කමිටු පත් කිරීම.**<br>යෝග්‍ය යැයි විධායක සභාව සලකන අවස්ථාවකදී, විධායක සභිකයින්ගෙන් හෝ සංගමයේ අනෙකුත් සාමාජිකයින්ගෙන් හෝ සමන්විත ඒක පුද්ගල හෝ බහු පුද්ගල අනු කමිටුවකට විධායක සභාව විසින් ස්වකීය වැඩ කටයුතු හා බලතලවලින් කිසිවක් පවරා දිය හැකිය. එසේ පවරනු ලැබූ වැඩ කටයුතු හා බලතල ක්‍රියාත්මක කිරීමේදී විධායක සභාව විසින් ඔවුන් වෙත පනවනු ලැබූ රීතිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |
| | | **13.11** | **විධායක සභාවේ පුරප්පාඩු** |
| 13.3.1 | | 13.11.1 | විධායක සභාපති ධූරයෙහි පුරප්පාඩුවක් ඇති වුවහොත් (විධායක සභාපතිවරයා පත්වී මාස 06ක් ඉක්ම වූ විට) ව්‍යවස්ථාවේ 13.1.4 (1) යටතේ පත්ව සිටින නියෝජ්‍ය සභාපතිවරයා, එම වසරේ ඉතිරි කාලය සඳහා විධායක සභාපතිවරයා වන්නේය. තවද එවැනි අවස්ථාවකදී ඊළඟට පැවැත්වෙන මහා සභා රැස්වීම තෙක් නියෝජ්‍ය සභාපති ධූරයේ වැඩ බැලීම සඳහා 13.1.4 (2) යටතේ පත්වූ උප සභාපතිවරුන් 03 දෙනාගෙන් කෙනෙකු විධායක සභාවේ වැඩි ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතුය. එවන් අවස්ථාවකදී ඉහත 13.1.9 සඳහන් කරන ලද සුදුසුකම් අදාල නොවේ.<br><br>එවිට පුරප්පාඩු වු උප සභාපති ධූරයේ වැඩ බැලීම සඳහා සුදුසුකම් ඇති අයෙකු විධායක සභාව විසින් පත්කරගනු ලැබේ.<br><br>යම් අවස්ථාවකදී විධායක සභාපති නියෝජ්‍ය සභාපති සහ උප සභාපති තනතුරු එකවර හිස්වූ අවස්ථාවකදී ඊලග වාර්ෂික මහා සභා රැස්වීම තෙක්, පසුගිය වසරේ හිටපු විධායක සභාපති, තත් වර්ෂයේ විධායක සභාපති ලෙස කටයුතු කරනු ලැබේ. එම කාලය මාස තුනකට වඩා වැඩි නම් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එම තනතුරු පිරවිය යුතුය.<br>එහෙත්, තත්කාලීන විධායක සභාපතිවරයා විධායක සභාපති ධූරයට පත් වූ දින සිට ප්‍රථම මාස 06 ඇතුළත එම ධූරයේ පුරප්පාඩුවක් වුවහොත් එම පුරප්පාඩුව ඊට ආසන්න වසරේ සභාපතිවරයා (පෙර |

| | | | |
|---|---|---|---|
| | | | සභාපතිවරයා) විසින් එළඹෙන වාර්ෂික මහා සභාව වන තෙක් දැරිය යුතුය. යම් හෙයකින් ඔහු එම තනතුරට පත් නොවන්නේ නම් තත්කාලීන සභාපතිවරයා විසින් එම තනතුරේ වැඩ ආවරණය කළ යුතුය. |
| 13.3.2 | | 13.11.2 | විධායක සභාපතිවරයෙකු සිය කාල සීමාව ඉකුත් වීමට පෙර විධායක සභාවට පිළිගත හැකි සාධාරණ හේතුවක් නොමැතිව ධුරයෙන් ඉවත් වුවහොත් ඔහුට ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී විධායක හෝ නියෝජ්‍ය සභාපති තනතුර සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ නොහැකිය. එවන් සාමාජිකයෙකු හට වසර 05ක විරාමයකින් පසුව විධායක සභාවේ වෙනත් තනතුරක් දැරීමෙන් අනතුරුව නියෝජ්‍ය සභාපති ධුරය සඳහා ඉල්ලුම් කළ හැකිය. |
| 13.3.3 | | 13.11.3 | විධායක සභාපති තනතුරෙහි පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීම සඳහා පත්වන තැනැත්තා ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී විධායක සභාපති තනතුරට තේරී පත් වුවහොත් ඔහුගේ නිල කාල සීමාවේ අඛණ්ඩතාව ගණන් ගනු ලබන්නේ එකී වාර්ෂික මහා සභා රැස්වීමේ සිටය. |
| 13.3.4 | | 13.11.4 | විධායක සභාවේ වෙනත් ඕනෑම ධුරයක පුරප්පාඩුවක් ඇති වුවහොත් මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට විධායක සභාවට බලය ඇත. |
| 13.3.5 | | 13.11.5 | එසේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී නාම යෝජනා කැඳවීම අවශ්‍ය නොවන අතර, එය මුළුමනින්ම විධායක සභාව විසින් තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් කරනු ලබන පත් කිරීමක් වන්නේය. |
| 13.3.6 | | 13.11.6 | විධායක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පූර්ව දැනුම් දීමකින් තොරව සහභාගි නොවන සාමාජික සාමාජිකාවන් විධායක සභාවෙන් සිය කැමැත්තෙන් අනිවාර්යෙන්ම ඉවත්වූවන් ලෙස සැලකිය යුතුය. ප්‍රධාන ලේකම් විසින් එම තත්ත්වය සභාවට දැන්වීමෙන් පසු එම පුරප්පාඩු ඇති වීමෙන් පසුව පවත්වන පළමුවන විධායක සභා රැස්වීමේදී 13.11.4 සහ 13.11.5 යන වගන්ති වලට අනුකූලව අදාළ පුරප්පාඩු පිරවිය යුතුය.<br><br>එක් පරිපාලන වර්ෂයක පැවැත්වෙන විධායක සභා රැස්වීම් සංඛ්‍යාවෙන් 50% ට අඩු රැස්වීම් වාර සංඛ්‍යාවකට සහභාගී වී ඇති කාරක සභිකයින් /නිලධාරීන් ඉදිරි වසරේ කාරක සභික ධුරයකට/නිලයකට ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි. |
| 13.3.7 | | 13.11.7 | ව්‍යවස්ථාවේ 19 වගන්තිය යටතේ විධායක සභාවේ ධුරයන් සඳහා නාම යෝජනා කැඳවීමෙන් පසුව, යම් හෙයකින් එකී ධුරයන් සියල්ල පිරවීමට අවශ්‍ය වලංගු නාම යෝජනා අදාළ කාලසීමාව තුළදී නොලැබී තිබුණහොත් එකී පුරප්පාඩු එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීමේදි මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව සාමාජිකයන්ගේ බහුතර කැමැත්තෙන් පිරවිය යුතුය. |
| 13.3.8<br><br><br>13.3.9 ඉවත් කර ඇත | | 13.11.8 | කිසියම් නිල දරන්නෙකු තම ඉල්ලා අස්වීම ලිඛිතව ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ වෙනත් ආකාරයකින් සංගමයේ සාමාජිකත්වය අහෝසි වීමෙන් තම නිල ධුරය අහෝසි වනු ඇත. ප්‍රධාන ලේකම් විසින් එවැනි ඉල්ලා අස්වීමක්, අස්වීම ලැබීමෙන් පසු පවත්වනු ලබන පළමු විධායක සභා රැස්වීම වෙත ඉදිරිපත් කළ යුතුය. |
| 13.4 | | **13.12** | **කළමනාකරණ මණ්ඩලය** |
| 13.4.1 | | 13.12.1 | කළමනාකරණ මණ්ඩලය සභාපති, විධායක සභාපති, ප්‍රධාන ලේකම්, හිටපු සභාපති, නියෝජ්‍ය සභාපති, නියෝජ්‍ය ලේකම්, උප සභාපතිවරු, භාණ්ඩාගාරික සහ සංස්කාරක යන නිලධාරීන්ගෙන් සමන්විත වේ. |
| 13.4.2 | | 13.12.2 | 13.10.1. හි සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වගකීම කළමනාකරණ මණ්ඩලය සතුය. එසේ පරිපාලන කටයුතු වලට අවශ්‍ය වන යම් සේවකයෙකුගේ හෝ සේවාදායක ආයතනයක |

| | | | |
|---|---|---|---|
| | | | සේවය ලබා ගැනීමට සහ ඊට අදාළ පිරිවැය අනුමත කිරීමට කළමනාකරණ මණ්ඩලයට බලය ඇත. එසේ වෙතත්, කළමනාකරණ මණ්ඩලයේ තීරණ ඊළඟට එළඹෙන විධායක සභාවේ ආවරණ අනුමැතියට අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. යම්කිසි කාර්යයක් සඳහා විධායක සභාවේ ආවරණ අනුමැතිය නොලැබුණ හොත් එම කාර්යය තවදුරටත් ඉදිරියට ගෙනයා නොහැක. |
| 13.4.3 | | 13.12.3 | කළමනාකරණ මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් 07 දෙනෙකි. විධායක සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික අනිවාර්යයෙන්ම සහභාගි විය යුතුය. |
| 14.1 | ගරු සභාපති | | තත් කාලීන ව්‍යවස්ථාවේ දක්වා ඇති ගරු සභාපති පදවිය ආදි ශිෂ්‍යයකු විසින් හෙබවූ නමුදු ගරු සභාපති පදවියට තත්කාලීන විදුහල්පති තුමා අමාත්‍යංශ චක්‍ර ලේඛයට අනුව පත් වන බැවින් යෝජිත ව්‍යවස්ථාවේ අංක 14.1 ගරු සභාපති ශීර්ෂය යටතේ අනු අංක 14.1.1, 14.1.2 සහ 14.1.3 යන වගන්ති යටතේ එම පදවියේ කාර්යභාර්ය දක්වා ඇත. |
| | | 14.1.1 | සංගමයේ සියලුම විධායක සභා, කලමනාකරණ මණ්ඩල සහ මහා සභා රැස්වීම් වල මුලසුන හෙබවීම සහ සංගමයේ ව්‍යවස්ථාවට අනුකූලව එම සභා මෙහෙයවීම. |
| | | 14.1.2 | සංගමයේ සියලු කටයුතු සාර්ථකව ඉදිරියට ගෙනයාම සඳහා විධායක සභිකයින්ට අවශ්‍ය උපදෙස් ලබාදීම. |
| | | 14.1.3 | සංගමය සතු චංචල හා නිශ්චල දේපළ සම්බන්ධයෙන් සාමාජිකත්වය වෙත වගවීම. |
| | | | ප්‍රධාන ආදි ශිෂ්‍ය නිලධාරියා ගරු විධායක සභාපති ලෙසත්, කෘත්‍යාධිකාරී මණ්ඩලය කලමණාකරන මණ්ඩලය ලෙසත් සියලුම තැන්හි සංශෝධනය වීමට යෝජිතය. |
| | | 14.2 | **ගරු විධායක සභාපති**<br>මොහු සංගමයේ ප්‍රධාන ආදි ශිෂ්‍ය නිලධාරියා වන අතර ඔහු විසින් ඉටු කළ යුතු කාර්යයන් අතර පහත දැක්වෙන කාර්යයන්ද ඇතුළත් වේ. |
| 14.1.1 | | 14.2.2 | අංකය පමණක් වෙනස් වී ඇත. |
| 14.1.2 | | | ගරු සභාපතිගේ කාර්යභාර්ය යටතේ සඳහන් කර ඇත. |
| 14.1.3 | | 14.2.4 | අංකය පමණක් වෙනස් වී ඇත. |
| 14.1.4 | | 14.2.5 | අංකය පමණක් වෙනස් වී ඇත. |
| 14.1.5 | | 14.2.6 | අංකය පමණක් වෙනස් වී ඇත. |
| | | 14.2.3 | තමාගේ නිල කාලය තුළ සංගමයේ ක්‍රියාත්මක කරන සියළු ව්‍යාපෘති වල සාර්ථකත්වය උදෙසා විධායක සභිකයින් මෙහෙයවීම සහ ඔවුන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම. |
| 14.2 | නියෝජ්‍ය සභාපති | 14.3 | අංකය වෙනස් වී ඇත. |
| 14.2.1 | | 14.3.1 | **විධායක සභාපති** විසින් ඉටුකළ යුතු කාර්යයන් කිරීමට ඔහුට නොහැකි අවස්ථාවල ඔහු වෙනුවෙන් එම කටයුතු විධායක සභාවේ /කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඉටු කිරීම. |
| 14.3 | උප සභාපතිවරු තිදෙනා | 14.4 | අංකය වෙනස් වී ඇත. |
| 14.3.5 | | | ඉවත් කර ඇත |
| 14.4 - 1,2,3,4,5,6, 7,8,9 | | 14.5- 14.5.1 සිට 14.5.10 | අංකය වෙනස් වී ඇත. |
| | | 14.5.1 නව වගන්තියකි | ආදි ශිෂ්‍ය කාර්යාලයේ පරිපාලන කටයුතු සහ එහි ලිපි ලේඛන නිවැරදිව සහ සුරක්ෂිතව පවත්වාගෙන යාම පිළිබඳ වගකීම |
| 14.4.3 | | 14. 5.4 | සභා සම්මත කරගත් වාර්තාවන්ගේ කිසියම් සංශෝධනයක් ඇත්නම් ඒවාද ඇතුළත් කිරීමෙන් පසුව සභාපතිගේ අත්සන රැගත් පිටපත වාර්තා පොතෙහි ඇතුළත් කිරීම සහ එහි පිටපතක් අනුශාසකවරුන්ට ලබාදීම. |

| | | | |
|---|---|---|---|
| 14.5<br>නියෝජ්‍ය<br>ලේකම් | | 14.6 | මොහු ප්‍රධාන ලේකම්ගේ කාර්යයන් ඉටුකිරීමට පොදුවේ සහාය විය යුතු අතර ප්‍රධාන ලේකම් නොමැති අවස්ථා වලදී එකී තනතුරට අදාල කාර්යයන් ආවරණය කල යුතුය. ප්‍රධාන ලේකම් ධූරයේ පුරප්පාඩු ඇති වූ අවස්ථා වලදි වැඩ ආවරණය කිරීම කල යුතුය. |
| | | 14.6.1 | නව වගන්තියකි.<br>**උප ලේකම්**<br>මොහු ප්‍රධාන ලේකම් සහ නියෝජ්‍ය ලේකම්ගේ කාර්යයන් වලට පොදුවේ සහය විය යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී එකී තනතුරු වලට අදාළ කාර්යයන් ආවරණය කිරීම සහ ප්‍රධාන ලේකම් විසින් පවරනු ලබන කාර්යයන් ඉටු කළ යුතුය. නියෝජ්‍ය ලේකම් ධූරයේ පුරප්පාඩු ඇති වූ අවස්ථාවලදි වැඩ ආවරණය කළ යුතුය. |
| 14.6 -<br>(1) සිට (8)<br>දක්වා | භාණ්ඩාගාරික | 14.7<br>14.7.1 සිට<br>14.7.7 | මෙතැන් සිට සියලුම තැන්හි **"රීති"** යන්න **"විධිවිධාන"** ලෙස සංශෝධනය කර ඇත. |
| 14.6 (3) | | 14.7.3 | සංගමයේ මුදල් භාරකරු වශයෙන් ක්‍රියා කිරීම ඒ පිළිබඳව සංගමයේ සාමාජිකයින්ට වගකීම සහ දශක කණ්ඩායම්වල මූල්‍ය කටයුතු පිළිබඳව විධායක සභාව දැනුවත් කිරීම. |
| 14.6 (.5) | | 14.7.5 | මෙම ව්‍යවස්ථාවේ **විධිවිධාන** වලට අනුකූලව මහා සභා, විධායක සභා සහ කළමනාකරණ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කිරීමට අවශ්‍ය සියළුම ගිණුම් වාර්තා කලට වේලාවට පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම. |
| 14.6 -(7) | | | ඉවත් කර ඇත. (භාණ්ඩාගාරිකගේ කාර්යයන් නොවන නිසා) |
| | | 14.7.7 | නව වගන්තියකි.<br>අභ්‍යන්තර විගණන කටයුතුවලදී එම කමිටුවට අවශ්‍ය පොත්පත් තොරතුරු ලේඛන ආදිය ලබාදීම. |
| 14.6 -(8) | | 13.6 | 14.6 -(8) ඉවත් වී 13.6 ට ඇතුලත් කර ඇත. |
| 14.8 - (1)<br>සිට (7) | 14.7 උප<br>භාණ්ඩාගාරික | 14.8 - 14.9.1<br>සිට 14.9.7 | අංකනය වෙනස් වී ඇත. |
| 14.6 (7) | | 14.9.7 | සංගමයේ වෙබ් අඩවිය යාවත් කාලින කිරීම හා පවත්වාගෙන යාම. |
| | | 14.9.8 | නව වගන්තියකි.<br>ජාතික ලේඛනාරාක්ෂාගාරයට ලබාදිය යුතු ලේඛණ නිසියාකාරව ලබාදීම. |
| | | 14.10 | නව වගන්තියකි.<br>**උප සංස්කාරක**<br>මොහු සංස්කාරකට අයත් කාර්යයන් ඉටු කිරීමට ඔහුට පොදුවේ සහය විය යුතු අතර මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට පටහැනි නොවන අයුරින් විධායක සභාව/සංස්කාරක විසින් කලින් කලට පවරනු ලබන කාර්යයන්ද උප සංස්කාරක විසින් ඉටු කළ යුතුය. |
| 14.9 | අනෙකුත්<br>විධායක සභා<br>සාමාජිකයින්<br>හා<br>සාමාජිකාවන් | 14.11 | අංකය වෙනස් වී ඇත. |
| 15 | | 15 | මින් ඉදිරියට සියලුම තැන්හි නියෝජ්‍ය සභාපති ගරු විධායක සභාපති ලෙසත් සංශෝධනය කර ඇත. |
| 16.1.1 | | 16.1.1 | විධායක සභාව විසින් ඉටුකල යුතු සාමාන්‍ය කටයුතු පිළිබඳ ක්‍රියා කිරීමට සභාවේ සාමාන්‍ය රැස්වීම් අවම වශයෙන් මසකට වරක්වත් පැවැත්විය යුතුය. මේ සඳහා අවම වශයෙන් දින 07කට පෙර දැනුම්දීමක් කළ යුතුය. |
| 16.1 (2) | | 16.1.2 | විධායක සභා සාමාජිකයින් දසදෙනෙකුගේවත් (10) අත්සන් සහිතව ප්‍රධාන ලේකම් වෙත හෝ සභාපති වෙත හෝ ඉදිරිපත් කරන අභියාචනාවක් මත විශේෂ විධායක සභා රැස්වීමක් ප්‍රධාන ලේකම් විසින් හෝ සභාපති විසින් හෝ එවැනි අභියාචනාවක් ලැබ දින 14ක් ඇතුළතදී, අවම වශයෙන් දින 05කට පෙර දැනුම් දීමකින් කැඳවිය යුතුය. විධායක සභාවේ අවශ්‍යතාව මත ද එවන් රැස්වීමක් |

| | | | |
|---|---|---|---|
| | | | කැඳවිය හැකිය. |
| 16.2 | | 16.2 | ඕනෑම විධායක සභා රැස්වීමක වැඩ කටයුතු පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයින් 20 දෙනෙකි. |
| 16.7 | | 16.7 | විධායක සභා සහ කළමනාකරණ මණ්ඩල රැස්වීමකදී ගනු ලබන තීරණ බහුතර ඡන්දයෙන් අනුමත විය යුතුය. ඡන්ද සමවූ අවස්ථාවකදී ද්විතීය තීරක ඡන්දයක් ගරු සභාපතිට හිමි වේ. |
| 17.1 | | 17 | 17.1 ඉවත් කර ඇත. එය කොටස් 03 ක් යටතේ 17/17.8/17.9 හි සඳහන් කර ඇත. |
| | | 17 | වාර්ෂික මහා සභා රැස්වීම |
| | | 17.1 | සංගමය විසින් සෑම ලිත් වර්ෂයකම වාර්ෂික මහා සභා රැස්වීමක පැවැත්විය යුතුය. විශේෂ අවස්ථාවකදී හැර වාර්ෂික මහා සභා රැස්වීම සෑම වර්ෂයකම මාර්තු මාසයේ පැවැත්විය යුතුය. |
| 17.2.1 | | 17.2 | වාර්ෂික මහා සභා රැස්වීමක් කිසියම් වර්ෂයක මාර්තු මාසයේදී පැවැත්විය යුතු වුවද ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරයෙහි පවත්නා හදිසි අවස්ථාවක හෝ ඇඳිරි නීති අවස්ථාවක් මත එවැනි රැස්වීමක් කල් දැමිය හැක. එවැනි කල් දැමීමක් උදෙසා පවතින විධායක සභාවට ආවරණ අනුමැතිය ලැබෙනු ඇත. |
| 17.2.2 | | 17.3 | එවැනි අවස්ථාවකදී පවතින විධායක සභාව සංගමයේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යනු ලබන අතර හදිසි අවස්ථාව හෝ ඇඳිරි නීතිය ඉවත් වූ වහාම දින 30 ක් ඇතුළතදී හෝ වෙනයම් ප්‍රායෝගික දිනයකදී කල් දමන ලද වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්විය යුතුය. |
| 17.2.3 | | 17.4 | වාර්ෂික මහා සභා රැස්වීමක න්‍යාය පත්‍රයට පහත සඳහන් කරුණු අවම වශයෙන් ඇතුළත් විය යුතුය.<br>(1) පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව කියවා සහා සම්මත කර ගැනීම.<br>(2) සංගමයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.<br>(3) ගරු විගණකගේ මතය ප්‍රකාශ කළ වාර්ෂික ගිණුම් වාර්තාව ඉදිරිපත් කර සහා සම්මත කරවා ගැනීම.<br>(4) ගරු අනුශාසක මණ්ඩලය සහ විනය කමිටුව පත් කිරීම<br>(5) රැස්වීමට දින 10 කට පෙර ලැබෙන සේ ප්‍රධාන ලේකම් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලද යෝජනා සභාවට ඉදිරිපත් කිරීම.<br>(6) ඉදිරි වර්ෂය සඳහා සාමාජිකයින් විසින් තෝරා පත් කර ගත යුතු කාරක සභිකවරුන් තෝරා පත් කර ගැනීම.<br>(7) ගරු විගණකවරයෙකු පත් කර ගැනීම.<br>(8) ඉහත කරුණු වලට අමතරව සාමාජිකයින්ගේ අනුමැතිය අවශ්‍ය වන ව්‍යවස්ථා සංශෝධන වැනි වෙනත් කරුණක් ඇතොත් විධායක සභාවේ අනුමැතියට යටත්ව න්‍යාය පත්‍රයේ පැහැදිලිව සටහන් කළ යුතුය. |
| 17.2.4 | | 17.5 | න්‍යාය පත්‍රය අඩංගු මහා සභා රැස්වීම කැඳවන දැන්වීම, සියලුම සාමාජිකයිනට යටත් පිරිසෙයින් දින 21 කට පෙර ලැබෙන සේ යැවිය යුතුය. |
| 17.2.5 | | 17.6 | රැස්වීමේදී සාකච්ඡාවට ගැනීමට නියමිත වාර්තා සහ ගිණුම් සියලුම සාමාජිකයින් වෙත රැස්වීම පැවැත්වීමට යටත් පිරිසෙයින් දින 3කට පෙර ලබා දිය යුතුය. |
| | | 17.7 නව වගන්තියකි | 13.8 වගන්තිය ප්‍රකාරව විධායක සභාව තෝරා පත් කර ගැනීමේදී 13.1 වගන්තියේ දක්වෙන තනතුරු සඳහා නියමිත ප්‍රමාණය ඉක්මවා වලංගු නාම යෝජනා ලැබී ඇති විට බහුතර සාමාජිකයින්ගේ කැමැත්ත පරිදි එකී තනතුරු සඳහා සුදුස්සන් පත්කර ගැනීම සඳහා රහස් ඡන්දයක් පැවැත්වෙනු ඇත. ඡන්දය පැවැත්වීමේ වගකීම තත්කාලීන විධායක සභාව සතුවේ. |
| 17.3 | විශේෂ මහා සභා රැස්වීම | 17.8<br>17.8.1 | **විශේෂ මහා සභා රැස්වීම**<br>විධායක සභාවට යෝග්‍ය යැයි තීරණය කරන ලද අවස්ථාවකදී මෙන්ම, විශේෂ මහ සභා රැස්වීමක් කැඳවීමේ අවශ්‍යතාවය පැහැදිලිව සඳහන් කරන ලද, සාමාජිකයින් 20කට නොඅඩු සංඛ්‍යාවකගේ අත්සන යෙදූ අභියාචනයක් සභාපති වෙත හෝ |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රධාන ලේකම් වෙත හෝ භාර දී දින 21 ක් ඇතුලත සභාපති හෝ ප්‍රධාන ලේකම් විසින් සංගමයේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය. |
| 17.3.1 | | 17.8.2 | විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට හේතු වූ විශේෂ කරුණ රැස්වීම කැඳවන දැන්වීමෙහි සඳහන් කල යුතු අතර, ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා කැඳවන රැස්වීමකදී හැර අන් සියලු අවස්ථා වලදි මෙම දැන්වීම සියළුම සාමාජිකයින්ට යටත් පිරිසෙයින් දින 14කට පෙර ලැබෙන සේ යැවිය යුතුය. |
| 17.3.2 | | 17.8.3 | අංකය වෙනස් වී ඇත. |
| 17.4.1 | | 17.9.1 | අංකය පමණක් වෙනස් වී ඇත. |
| 17.4.2 | | 17.9.2 | අංකය පමණක් වෙනස් වී ඇත. |
| 17.5 | | 17.10 | යම් මහා සභා රැස්වීමක් ආරම්භ කිරීමට නියමිත වේලාවේ සිට විනාඩි හතලිස් පහක් ඇතුළත ගණපූරණයක් නොමැති නම් එවන් අවස්ථාවකදී එම මහා සභා රැස්වීම, ඉන්පසුව එළඹෙන සතියේ එම දිනයේ එම වේලාව තෙක් කල් තැබීමේ බලය ගරු සභාපතිතුමා සතු වේ. එසේ කල් තබන ලද රැස්වීමකට නැවත ලිඛිත දැනුම් දීමක් නොකරන අතර, එම රැස්වීමට පැමිණෙන ඕනෑම සංඛ්‍යාවක් ගණපූරණය ලෙස සලකා රැස්වීම පවත්වා ගෙන යා යුතුය. |
| 17.6 | | 17.11 | මෙම ව්‍යවස්ථාවේ අන්‍යාකාරයෙන් සඳහන් කර නොමැති නම් කිසියම් මහා සභා රැස්වීමකදී සාමාජිකයින් විසින් සම්මත කල යුතු යෝජනා සම්මතයන් රැස්වීමට පැමිණ ඡන්දය දෙනු ලබන සාමාජිකයින්ගේ සාමාන්‍ය බහුතරයෙන් (50% වැඩි) සම්මත කරගත යුතුය. |
| 17.7 | | 17.12 | කිසියම් මහා සභා රැස්වීමකදී ඡන්ද බලය හිමිවනුයේ යාවජීව සාමාජිකයින්ට හා සාමාජික මුදල් ගෙවා තිබෙන සාමාජිකත්වය අහෝසි වී නොමැති සාමාන්‍ය සාමාජිකයින්ට පමණි. |
| 18 | දැන්වීම් | 18 | **රැස්වීම් කැඳවීමේ නිවේදන** |
| | | 18.3 හා 18.4 | ඉවත්කර ඇත. අදාළ තැන්හි යොදා ඇත. |
| 19.1 | | 19.1 | සියලු නාම යෝජනා පත්‍ර ව්‍යවස්ථාවේ 19.2 ඡේදයට අනුකූලව විය යුතුය. නාම යෝජනා පත්‍රය ව්‍යවස්ථාවේ උපලේඛණ iv අනුව ඇති නිල ආකෘති පත්‍රය මගින් නිසි පරිදි ඉදිරිපත් කළ යුතුය. |
| 19.2 | | 19.2 | සියලු නාම යෝජනා පත්‍ර ප්‍රධාන ලේකම් විසින් පවත්වාගෙන යනු ලබන සාමාජික ලේඛණ අනුව සාමාජිකත්වය හිමි සාමාජිකයින් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වයෙන් ඉදිරිපත් විය යුතු අතර, ඒ සඳහා අපේක්ෂකයාගේ කැමැත්ත ද ලිඛිතව තිබිය යුතුය. නාම යෝජනා ඉදිරිපත් කල හැක්කේ මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුව ඡන්ද බලය හිමි සාමාජිකයින්ට පමණි. |
| 19.7 | | 19.7 | වාර්ෂික මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රය අනුව විධායක සභාව තෝරා පත් කරගන්නා අවස්ථාවේදී අපේක්ෂකයා අනිවාර්යයෙන්ම සභා ගැබේ රැදී සිටිය යුතුය. යම් හෙයකින් නාම යෝජනා ඉදිරිපත් කර ඇති අපේක්ෂකයා මහා සභා රැස්වීමට නොපැමිණෙන්නේ නම් හෝ පැමිණීමට නොහැකි වන්නේ නම් ඒ සඳහා පිළිගත හැකි හේතු සභාපතිට ඉදිරිපත් කළ යුතුය. ඒ පිළිබඳව අවසාන තීරණය සභාපති සතුය. එම අපේක්ෂකයාගේ නම නිෂ්ප්‍රභා වුවහොත් එම හේතුව නිසා ඇති වන පුරප්පාඩුව විධායක මණ්ඩලයේ නිලයක් දැරීමට අවශ්‍ය ව්‍යවස්ථා විධිවිධාන වලට අනුකූලව එකී මහා සභාව විසින් පිරවිය යුතුය. මෙය විධායක සභාපතිට අදාළ නොවේ. |
| 20.1 | | 20.1 | නාම යෝජනා පිරික්සනු ලබන්නේ අනුශාසකවරු දෙදෙනෙක්, ගරු සභාපති, ප්‍රධාන ලේකම්, හා විධායක සභික යෙකුගෙන් සමන්විත වූ කමිටුවක් මගිනි. එසේ පත්වනු ලබන විධායක සභිකයා අදාළ වර්ෂයේ කිසිදු තනතුරක් සඳහා නාමයෝජන භාර නොදෙන අයෙකු විය යුතුය. නාමයෝජනා මණ්ඩලයේ කටයුතු වලට සහය දීම සඳහා භාණ්ඩාගාරික වරයාට සහභාගි විය හැක. |
| 20.3 | | 20.3 | සංගමයේ නිලලේඛන වලට අනුකූල නොවන සහ වෙනත් ව්‍යවස්ථානුකූල විධිවිධානවලට පටහැනි ඉල්ලුම්පත් පිළිබඳව ප්‍රධාන ලේකම් විසින් අපේක්ෂකයාටත් යෝජනාකරුට හා ස්ථිරකරුටත් , |

| | | | |
|---|---|---|---|
| | | | ඉල්ලුම්පත් පරීක්‍ෂා කරනු ලබන දින සිට දින හතක් (07)ක් ඉක්මවීමට ප්‍රථම ලියාපදිංචි තැපැල් මගින් ලිඛිතව දැනුම් දිය යුතුය. |
| 20.4 | | 20.4 | යම් විරුද්ධතාවක් වේ නම් ඒ පිළිබඳව නිවේදන ලැබී දින හතක (07) ඉක්මවීමට ප්‍රථම ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් අභියාචනයක් ප්‍රධාන ලේකම් මගින් විධායක සභාවට එවිය යුතුය. අදාළ අභියාචනය සම්බන්ධයෙන් කටයුතු කිරීම නාම යෝජනා මණ්ඩලය නියෝජනය නොකළ සෙසු අනුශාසකවරු තිදෙනා විසින් කල යුතුය. එම තිදෙනාගේ බහුතර තීන්දුව අවසාන තීරණය වේ. |
| 25.1 | | 25.1 | භාණ්ඩාගාරිකගේ සුපරීක්‍ෂණය යටතේ කාර්යාලයේ කළමනාාකරු විසින් සංගමයට අයත් වන සියලුම මුදල් භාර ගැනීම, එම මුදල් කළමණාකරණ මණ්ඩලයේ නිර්දේශය මත විධායක සභාව අනුමත කළ ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් වාණිජ බැංකුවක සංගමයේ නමින් හෝ වෙනත් ව්‍යාපෘති නාමයකින් තැන්පත් කිරීම, සහ ගිණුම් තැබීම කළ යුතුය. |
| 25.2 | | 25.2 | යම් මුදල් ඉපයීමේ ව්‍යාපෘතියක් සංගමයේ අනුදැනුම යටතේ ක්‍රියාත්මක වන අවස්ථාවලදී එම ව්‍යාපෘතියේ ස්වභාවය අනුව රැස්වන මුදල් අවම වශයෙන් දින තුනකට වරක් (3) භාණ්ඩාගාරික වරයා වෙත භාරදීමේ වගකීම ව්‍යාපෘති ප්‍රධානියාවිසින් දැරිය යුතුය. එසේ නොමැති නම් ඒ පිළිබඳව විධායක සභාව දැනුවත් කර මුදල් භාරදෙනු ලබන කාලසීමාව පිළිබඳව එකඟතාවකට පැමිණිය යුතුය. |
| 25.4 | | 25.5 | අංකය වෙනස් වී ඇත. |
| 25.5 | | 25.6 | අංකය වෙනස් වී ඇත. |
| 25.7 | | 25.7 | සංගමයේ යාවජීව මුදල් අදාල ගිණුමට බැර කල යුතු අතර එම මුදල් තැන්පත් කල හැක්කේ ඒ සඳහා විශේෂයෙන් විවෘත කරන ලද තැන්පත් ගිණුමකය. මෙසේ තැන්පත් කල මුදල් එම ගිණුමෙන් ඉවත්කර වියදම් කළ හැකි වන්නේ මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී හෝ වැඩි ඡන්දයෙන් අනුමැතිය ලදහොත් පමණි. එසේ වුවද පොළී ආදායම වැඩිකර ගැනීම පිණිස යාවජීව සාමාජික තැන්පත් ගිණුම් වල ඇති මුදල් ප්‍රතිව්‍යුහගත කර නව ස්ථිර තැන්පත් ගිණුම් විවෘත කිරීමේ බලය විධායක සභාව සතුවේ. එසේ කරන ලද අවස්ථා වලදී එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී එම කරුණ පිළිබඳව සාමාජිකයින් දැනුවත් කිරීම සිදුකළ යුතුය. |
| 25.8 | | 25.8 | 25.7 සඳහන් කර ඇති ගිණුමට බැර වන පොළිය පමණක් විධායක සභාවේ අනුමැතියෙන් සංගමයේ කටයුතු සඳහා යොදා ගත හැකිය. |
| 25.11 | | 25.11 | විධායක සභාව විසින් අනුමත කරනු ලැබූ ව්‍යාපෘති සඳහා සම්පූර්ණ විධායක සභා රැස්වීමක තුනෙන් දෙකක (2/3) ක අනුමැතියට යටත්ව පිළිගත් මුදල් ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ එසේ ණයට ගනු ලබන මුදල් සඳහා ඇපවීමට හෝ විධායක මණ්ඩලයට බලය ඇත. එවන් අවස්ථාවකදී එළඹෙන මහා සභා රැස්වීමකදී සාමාජිකයින් දැනුවත් කිරීම සිදුකළ යුතුය. |
| 27.3.4.1 | | 27.3.4.1 | එහි මුදල් වර්ෂය අවසානයේදී සංගමයේ වත්කම් හා වගකීම් පිළිබඳ තත්ත්වය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක් මගින්ද, |
| 28 | | 27.3.5 | **පොත් බැලීමේ අයිතිය.** සිය කාර්යය ඉටු කිරීම සඳහා යෝග්‍යයැයි විගණක විසින් සලකනු ලබන ඕනෑම අවස්ථාවකදී සංගමයේ සහ දශක කණ්ඩායම් වල පොත්, ගිණුම්, වවුචර් හා සියලු ලේඛන හා වාර්තා පරීක්ෂා කිරීමේ අයිතියක් විගණකට තිබිය යුතු අතර විගණකවරයා එම කාර්යය ඉටු කිරීම සඳහා ඔහුට අවශ්‍ය යැයි හැඟෙන තොරතුරු හා පැහැදිලි කිරීම් සංගමයේ හිටපු සහ /හෝ දැනට සිටින විධායක සභා සාමාජිකයින්ගෙන් ඉල්ලා සිටීමේ අයිතියක්ද ඔහුට තිබිය යුතුයි. |
| 29 | | 28 | අභ්‍යන්තර විගණන කමිටුව ලෙස සංශෝධනය වී නව වගන්ති ඇතුළත් කර ඇත. |
| | | 28.1 සිට 28.7 | සංගමයේ සහ දශක කණ්ඩායම්හි මූල්‍ය කටයුතු, ගිණුම් කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | දක්වා නව වගන්තියකි | හෝ මූල්‍ය සහ ගිණුම් සම්බන්ධ බලපෑමක් ඇති පරිපාලන කටයුතු හෝ එකී ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන මුදල් ඉපයීමේ හෝ යෙදවීමේ ව්‍යාපෘතින් සම්බන්ධ ගිණුම් කටයුතු පිළිබඳව විගණනය කොට වාර්තා කිරීම පිණිස කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ මත 05 දෙනෙකුගෙන් සමන්විත ස්වාධීන කමිටුවක් පත් කිරීම සෑම වර්ෂයකම වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසුව රැස්වන ප්‍රථම විධායක සභා රැස්වීමේදී සිදුකළ යුතුය. එම සාමාජිකයින් අතරින් අවම වශයෙන් දෙදෙනෙකු ගණකාධිකරණ සහ විගණන ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්දක් ඇති පුද්ගලයින් විය යුතුය. |
| | | 28.2 | එක් එක් විගණන කාර්යය සඳහා අවම වශයෙන් සාමාජිකයින් තිදෙනෙකුගෙන් (3) සමන්විත විගණන කමිටුවක් පත් කළ යුතු අතර අවම වශයෙන් ඉන් එක් අයෙකු ගණකාධිකරණ සහ විගණන ක්ෂේත්‍රයේ වෘත්තීමය සුදුසුකමක් හා පළපුරුද්දක් ඇති අයෙකු විය යුතුය. |
| | | 28.3 | යම් ගිණුමක් විගණනය කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය මගින් අදාළ විගණන කාර්ය පැහැදිලිව සඳහන් කරමින් සංගමයේ ප්‍රධාන ලේකම්ගේ අත්සනින් විගණක කමිටුවේ සාමාජිකයින් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. |
| | | 28.4 | අදාළ විගණන කාර්යය ආදි ශිෂ්‍ය සංගමයේ මූල්‍ය ගිණුම් හෝ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් නම්, එම විගණන කමිටුව සඳහා පත් කරනු ලබන සාමාජිකයින් පසුගිය වසර දෙකක් (02) තුළ හෝ අදාළ වර්ෂයේ සංගමයේ විධායක සභාවේ තනතුරු දරන ලද හෝ දරණ සාමාජිකයින් නොවිය යුතුය. එසේම අදාළ විගණන කටයුත්ත දශක කණ්ඩායමක් සම්බන්ධයෙන් නම්, අදාළ කණ්ඩායමේ කිසිම සාමාජිකයකු එම කමිටුවේ සාමාජිකයකු නොවිය යුතුය. |
| | | 28.5 | විගණන විෂය පථය තීරණය කිරීම සහ විගණන කාර්යය සඳහා අවශ්‍ය ගිණුම් පොත්, ගිණුම් වාර්තා සැසඳීම, ලේඛන, ප්‍රකාශන, පොත්පත්, රැස්වීම් වාර්තා, බැංකුවේ ගිණුම් විස්තර, තොග වාර්තා, සහතික, තහවුරු කිරීම් වෙනත් අදාළ ලියකියවිලි සහ විස්තර කැඳවීමේ සහ ලබාගැනීමේ බලය විගණන කමිටුව සතු වේ. |
| | | 28.6 | විගණන කාර්යය සඳහා අවශ්‍ය වන ලිඛිත හෝ වාචික සාක්ෂි සංගමයේ නිලධාරින්ගෙන්, සාමාජිකයින්ගෙන්, ස්වකයන්ගෙන් හෝ වෙනත් ඕනෑම පාර්ශවයකින් කැඳවීමේ හෝ ලබාගැනීමේ බලය විගණන කමිටුව සතු වේ. |
| | | 28.7 | එක් එක් විගණන කටයුත්ත අවසානයේ විගණනයට භාජනය වූ විෂය සම්බන්ධයෙන් විස්තරාත්මක විගණන වාර්තාවක්, එකී විගණන කටයුත්ත සඳහා විගණන කමිටුව පත් කිරීමේ දින සිට එක් මසක් (1) ක් ඇතුළත, විගණන කමිටුවේ මතය හා නිර්දේශ සමග විගණන කමිටුවේ සාමාජිකයින්ගේ අත්සනින් කළමනාකරණ මණ්ඩලය වෙත ලේකම්තුමා මගින් ඉදිරිපත් කළ යුතුය. |
| 32 | ව්‍යවස්ථා සංශෝධනය | 31 | නව වගන්ති ඇතුළත් වි ඇත. |
| 32.1 | | 31.1 | තත් කාලීන ව්‍යවස්ථාවට සංශෝධන අවශ්‍යයැයි හැගියන අවස්ථාවක ඒ සඳහා සුදුසු සංශෝධන කෙටුම්පත් කිරීමට කමිටුවක් පත් කිරීමේ බලය විධායක සභාව සතුවේ. එම කමිටුව සඳහා අවම වශයෙන් එක් දශක කණ්ඩායමකින් නියෝජිතයින් දෙදෙනෙකු පත් කළ යුතුය. එසේ පත් කරන ලද කමිටුවේ නිර්දේශ සංශෝධන සහිතව හෝ රහිතව විධායක සභාවේ වැඩි ඡන්දයෙන් සම්මත වු පසු සාමාජිකයන්ගේ අනුමැතිය සඳහා එමකාර්යය වෙනුවෙන් කැඳවන ලද විශේෂ මහා සභා රැස්වීමකට හෝ එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. |
| 32.2 | | 31.2 | එවන් කෙටුම්පතක් සාමාජිකයින් වෙත ලැබුණු පසු ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමේ බලය සාමාජිකයින් සතුය. එවන් සංශෝධන ඇතොත් අවම වශයෙන් යෝජිත වාර්ෂික මහා සභා/ විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත දිනයට දින 10කට |

| | | | |
|---|---|---|---|
| | | | පෙර සංගමයේ ප්‍රධාන ලේකම් වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. එසේ ලැබෙන සංශෝධන විධායක සභාවේ තුනෙන් දෙකක බහුතරයකින් සම්මත වුවහොත් පමණක් අවසන් කෙටුම්පතට ඇතුළත් කළ හැකිය. ප්‍රතික්ෂේප වන යෝජනා හේතු සහිතව අදාළ මහා සභාවට ඉදිරිපත් කල යුතුය. |
| | | 31.3 | සංශෝධන ඇතුලත් සමස්ත ව්‍යවස්ථාව ආදි ශිෂ්‍ය සංගමයේ නව ව්‍යවස්ථාව ලෙස හෝ සංශෝධන කිහිපයක් පමණක් වන අවස්ථාවක දි සංශෝධිත වගන්තීන් සියල්ලම වාර්ෂික හෝ විශේෂ මහ සභා රැස්වීමකදී ගණපූරණයට යටත්ව ඡන්දය විමසන අවස්ථාවේදී සභා ගැබේ රැදී සිටින සාමාජිකයින්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් සම්මත විය යුතුය. |
| 32.3 | | 31.4 | තත්කාලීන ව්‍යවස්ථාවට සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කිරීමේ අයිතිය සංගමයේ සාමාජිකයන්ටද ඇත. එවන් යෝජනාවක් සාමාජිකයන් පනහකට (50) නොඅඩු සංඛ්‍යාවකගේ අත්සන් සහිතව තත්කාලීන විධායක සභාවේ ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. මෙවැනි යෝජනාවක් ඉදිරිපත් වී ඇති අවස්ථාවකදී විධායක සභාවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් එම සංශෝධන අනුමත කරන්නේ නම් එසේ කළ පසු මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුව විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම සිදුකළ හැක. යම් යෝජනාවක් ප්‍රතික්ෂේප වුවහොත් ඒ බැව් යෝජකයින්ට ලියාපදිංචි තැපෑලෙන් දැන්විය යුතුය. |
| 32.4 | | 31.5 | ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා කැඳවන විශේෂ මහා සභාරැස්වීම කැඳවීමේ නිවේදනය සමග යෝජිත සංශෝධන සාමාජිකයින් වෙත ලබාදිය යුතු අතර මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වලට අනුව රැස්වීම කැඳවිය යුතුය. ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා කැඳවන විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමේ නිවේදනය සියළුම සාමාජිකයින් වෙත රැස්විම පැවැත්වෙන දිනට දින 21 කට පෙර ලැබෙන සේ යැවිය යුතුය. |
| 35 | | 34 | අර්ථ නිරූපනය. (නව වගත්ති ඇතුළත් වී ඇත.) |
| | | 34.1.4 | "දශක සංවිධාන" යනු පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින්ගෙන් සැදුම්ලත් සියලුම දශක ආවරණය කරන සංවිධාන වේ. |
| 35.1.4 | | 34.1.5 | "අනුබද්ධ සංවිධාන" යනු පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින්ගෙන් සමන්විත මෙම ව්‍යවස්ථාවේ 10.1 හි සඳහන් උද්ධෘත යටතේ, පිහිටුවාගත් මවු සංගමය විසින් පිළිගත් සංවිධාන වේ. |
| 35.1.6 | | 34.1.7 | "කලමනාකරණ මණ්ඩලය" යනු ධර්මපාල විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ කලමනාකරණ මණ්ඩලයයි. |
| | | 34.1.9 | ''දැන්වීම'' යනු වාචික, ලිඛිත, කෙටි පණිවිඩ, විද්‍යුත් තැපැල හෝ පුවත්පත් දැන්වීම මගින් කරන දැන්වීමකි. |
| | | 34.1.10 | "සංගමයේ ගිණුම්" යනු දශක කණ්ඩායම් හි ගිණුම් ද ඇතුළත් ඒකාබද්ධ ගිණුම් වේ. |
| | | 34.1.11 | "නිලධාරියා" යනු තත්කාලීන විධායක සභාවේ කළමනාකරණ මණ්ඩලය (13. 12.1) නියෝජනය කරන නිලධාරින් හා උප ලේකම්, උප භාණ්ඩාගාරික සහ උප සංස්කාරක ද අයත් වේ. |
| 37 | **ඇමුණුම්** | 36 | **උප ලේඛණ**<br>I. පාසල් ධජය සහ පාසල් ගීතය<br>II. සාමාජික අයදුම් පත්‍රය<br>III. දැනට පිළිගත් දශක සහ අනුබද්ධිත කණ්ඩායම් වල නාම ලේඛනය<br>IV. නාම යෝජනා ආකෘති පත්‍රය |